කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

---

No SF-12-R

## වර්ෂ 2020 දෙසැම්බර් සිට **2021** පෙබරවාරි දක්වා දිගු කාලීන, මාසික හා සතිපතා වර්ෂාපතන

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඍතුමය අනාවැකිකරන අංශය මගින් 2020 දෙසැම්බර් 02 වන දින නිකුත් කරන ලදී.**

---

දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා වන මෙම ඍතුමය අනාවැකිය, පවතින ගෝලීය දේශගුණ සාධක මෙන්ම ගෝලීය දේශගුණ ආකෘති අනාවැකි වලට සහ පවත්නා වායුගෝලීය තත්ත්වයන්ට අනුව සකස් කර ඇත. වර්තමානයේ ලානිනා (La-Nina) තත්ත්වයක් නිවර්තන පැසිපික් සාගරයේ පවත්නා අතර උදාසීන ඉන්දියානු ද්වීධ්‍රැව(IOD) තත්ත්වයක් ඉන්දියානු සාගර කලාපයේ පවතී. මෙම තත්ත්වයන් දිවයිනේ දේශගුණ විචලනය සඳහා බලපෑම් ඇති කරන අතර ගෝලීය අනාවැකි වලට අනුව ඒවායේ විචලනය දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ඒකාකාරී වනු ඇත. ඒ අනුව 2020 දෙසැම්බර් සිට 2021 පෙබරවාරි කාලය තුල දිවයිනේ දීර්ඝකාලීන, මාසික හා සතිපතා වර්ෂාපතන පුරෝකථනයන් සහ දෙසැම්බර් මාසය සඳහා උෂ්ණත්වය පිළිබඳ අනාවැකි පහත අකාර වේ.

## <u>2020 දෙසැම්බර් සිට 2021 පෙබරවාරි දක්වා ඍතුමය වර්ෂාපතනය අනාවැකිය</u>



**රූපය 01: 2020 දෙසැම්බර් සිට -2021 පෙබරවාරි දක්වා ඍතුමය වර්ෂාපතන අනාවැකිය.**

2020 දෙසැම්බර් සිට 2021 පෙබරවාරි දක්වා කාලය තුල දිවයිනේ බොහෝ ප්‍රදේශ වල මෙම කාලයේ බලාපොරොත්තු වන **සාමාන්‍යයය (near normal) වර්ෂාපතනයට වඩා වැඩි වර්ෂාපතනයක්** ඇති විය හැකි අතර විශේෂයෙන් උතුරු, නැගෙනහිර, උතුරුමැද සහ ඌව පළාත්වල මෙම තත්ත්වය වැඩි වශයෙන් දැකගත හැකියි.

## <u>2020 දෙසැම්බර්, 2021 ජනවාරි සහ 2021 පෙබරවාරි සඳහා මාසික වර්ෂාපතන අනාවැකි</u>

| මාසය | වර්ෂාපතන අනාවැකිය |
|---|---|
|  දෙසැම්බර් 2020 | දිවයිනේ බොහෝ ප්‍රදේශ වල සාමාන්‍යයට වැඩි වර්ෂාපතනයක් ඇති විය හැකි අතර විශේෂයෙන් උතුරු, නැගෙනහිර, උතුරුමැද සහ ඌව පළාත්වල මෙම තත්ත්වය වැඩි වශයෙන් දැකගත හැකියි. |
|  ජනවාරි 2021 | දිවයිනේ බොහෝ ප්‍රදේශ වල සාමාන්‍යයට වැඩි වර්ෂාපතනයක් ඇති විය හැකි අතර විශේෂයෙන් උතුරු, නැගෙනහිර, උතුරුමැද සහ ඌව පළාත්වල මෙම තත්ත්වය වැඩි වශයෙන් දැකගත හැකියි. |
|  පෙබරවාරි 2021 | දිවයිනේ බොහෝ ප්‍රදේශ වල සාමාන්‍යයට වැඩි වර්ෂාපතනයක් ඇති විය හැකි අතර විශේෂයෙන් උතුරු, නැගෙනහිර, උතුරුමැද සහ ඌව පළාත්වල මෙම තත්ත්වය වැඩි වශයෙන් දැකගත හැකියි. |

**රූපය 02: 2020 දෙසැම්බර්, 2021 ජනවාරි සහ 2021 පෙබරවාරි සඳහා මාසික වර්ෂාපතන අනාවැකිය**

කෙසේ වෙතත්, වායුගෝලයේ දෛනිකව සිදුවන වෙනස්වීම්, මැඩන්ජූලියන් දෝලනය (Madden Julian Oscillation-MJO) වැනි අන්තර් ඍතුමය දෝලනයන් මෙන්ම විශේෂයෙන් දෙසැම්බර් කාලයේ දිවයින ආසන්නයේ මෙන්ම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ ඇතිවන අඩු පීඩන කලාප, පීඩන අවපාතයන් මෙන්ම සුළි කුණාටු හේතුවෙන් මෙම දිගු කාලීන අනාවැකි වෙනස් වීමට ඉඩ ඇත.

(දිස්ත්‍රික් මට්ටමින් දිගු කාලීන සාමාන්‍යයය(මධ්‍යන්‍ය) වර්ෂාපතන අගයන් ඇමුණුම -1 හි දක්වා ඇත)





# 2020 දෙසැම්බර් මාසය සඳහා සතිපතා වර්ෂාපතන අනාවැකිය

සතිපතා වර්ෂාපතන අනාවැකිය

මූලාශ්‍රය- ECMWF


යාවත්කාලීන කිරීම- 2020 නොවැම්බර් 29





| | |
|---|---|
|   | • දිවයිනේ බොහෝ ප්‍රදේශවල සාමාන්‍යයට වැඩි වර්ෂාපතනයක් ලැබීමේ හැකියාවක් ඇති, දිවයිනේ නිරිත සහ දකුණු දිග ප්‍රදේශ වල සාමාන්‍ය වර්ෂාපතනයක් ඇති විය හැක. |
|   | • දිවයිනේ බොහෝ ප්‍රදේශවල සාමාන්‍ය වර්ෂාපතනයක් ලැබීමේ හැකියාවක් ඇති අතර කෙසේ වෙතත්, නිරිතදිග වෙරළබඩ ආසන්න ප්‍රදේශ වල සාමාන්‍යයට අඩු වර්ෂාපතනයක් ඇති විය හැකිය. |
|   | • දිවයිනේ බොහෝ ප්‍රදේශවල සාමාන්‍ය වර්ෂාපතනයක් ලැබීමේ හැකියාවක් ඇත. |
|   | • දිවයිනේ බොහෝ ප්‍රදේශවල සාමාන්‍ය වර්ෂාපතනයක් ලැබීමේ හැකියාවක් ඇත. |

**රූපය 03: 2020 දෙසැම්බර් මාසය සඳහා සතිපතා වර්ෂාපතන අනාවැකිය**

**2020 ඔක්තෝබර් මාසයේදී නිරීක්ෂිත වර්ෂාපතනය මධ්‍යන්‍ය (1981-2010) සමග විචලනය**




a




b

මධ්‍යන්‍ය වර්ෂාපතන විචල්‍යතාව

- සාමාන්‍යයට වැඩි

110 %<වර්ෂාපතන විචල්‍යතාවය

- සාමාන්‍යය

90%≤වර්ෂාපතන විචල්‍යතා≤110 %

- සාමාන්‍යයට අඩු

**රූපය 04: 2020 නොවැම්බර් මාසයේදී නිරීක්ෂිත වර්ෂාපතනය( a) සහ නිරීක්ෂිත වර්ෂාපතනය සාමාන්‍යයෙන්(percentage of mean-1981-2010) ප්‍රතිශතයක් ලෙස (b)**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතු දත්ත වලට අනුව 2020 නොවැම්බර් මාසයේදී දිවයිනේ උතුරු සහ වයඹ දිග ප්‍රදේශ වල මෙන්ම ත්‍රිකුණාමලය, අනුරාධපුර, ගාල්ල, මාතර සහ රත්නපුර ප්‍රදේශ සාමාන්‍යයට (එනම් මෙම මාසයේ සාමාන්‍යයෙන් බලාපොරොත්තු වන වර්ෂාපතනයට) වඩා වැඩි වර්ෂාපතනයක්ද අනෙකුත් ප්‍රදේශ වල සාමාන්‍යයට අඩු වර්ෂාපතනයක් වාර්තා වී ඇත (රූපය 04).

**පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවධානය යොමු කළ යුතුය.**

- ගංවතුර, නාය යෑම් සහ සුළි කුණාටු වැනි දෑ සම්බන්ධයෙන් ගත හැකි පූර්වොපායයන් පිළිබඳව
- කෘෂිකාර්මික, ජලසම්පත්, වාරිමාර්ග සහ කාලගුණ සම්බන්ධ ආපදා පිළිබඳ වගකිව යුතු ආයතන මගින් විටින් විට සිදු කරනු ලබන දැනුවත් කිරීම් පිළිබඳව මහජනතාව වැඩි අවධානයක් යොමු කල යුතුය.

## ඇමුණුම-1

## දෙසැම්බර්, දෙසැම්බර් සහ පෙබරවාරි මාස සඳහා දිස්ත්‍රික් සාමාන්‍යයය වර්ෂාපතනය

## (අවුරුදු 30 සාමාන්‍යයය (1961-1990)

| දිස්ත්‍රික්කය | දෙසැම්බර් මාසය සඳහා සාමාන්‍යයය වර්ෂාපතනය (mm) | ජනවාරි මාසය සඳහා සාමාන්‍යයය වර්ෂාපතනය (mm) | පෙබරවාරි මාසය සඳහා සාමාන්‍යයය වර්ෂාපතනය (mm) |
|---|---|---|---|
| කොළඹ | 191.7 | 77.2 | 89.7 |
| කළුතර | 258.0 | 122.7 | 119.3 |
| ගාල්ල | 239.6 | 127.0 | 118.2 |
| මාතර | 219.9 | 125.2 | 99.7 |
| හම්බන්තොට | 159.2 | 70.9 | 63.7 |
| අම්පාර | 350.5 | 210.1 | 144.9 |
| මඩකලපුව | 388.0 | 194.3 | 121.9 |
| ත්‍රිකුණාමලය | 335.6 | 127.4 | 82.4 |
| මුලතිව් | 291.0 | 77.2 | 59.9 |
| යාපනය | 257.4 | 70.7 | 32.5 |
| කිලිනොච්චි | 274.0 | 76.7 | 50.3 |
| මන්නාරම | 206.4 | 53.8 | 48.4 |
| පුත්තලම | 126.2 | 46.9 | 38.5 |
| ගම්පහ | 141.1 | 53.7 | 76.8 |
| කෑගල්ල | 188.5 | 77.4 | 98.3 |
| රත්නපුර | 231.5 | 117.0 | 117.9 |
| මොණරාගල | 253.5 | 129.7 | 110.4 |
| බදුල්ල | 356.1 | 232.3 | 160.6 |
| පොළොන්නරුව | 369.5 | 164.1 | 106.2 |
| වවුනියා | 256.7 | 74.2 | 53.7 |
| අනුරාධපුර | 232.8 | 84.6 | 55.7 |
| කුරුණෑගල | 150.2 | 63.5 | 62.5 |
| මාතලේ | 357.7 | 202.0 | 121.5 |
| මහනුවර | 308.8 | 159.8 | 118.3 |
| නුවර එළිය | 250.1 | 138.3 | 104.8 |

**වගුව-01: දෙසැම්බර්, ජනවාරි සහ පෙබරවාරි මාස තුළ සාමාන්‍ය (1961-1990) වර්ෂාපතනය දිස්ත්‍රික් මට්ටමින්.**

එක් එක් දිස්ත්‍රික්කවල දෙසැම්බර්, ජනවාරි සහ පෙබරවාරි මාස තුළ සාමාන්‍ය (අවුරුදු 30 ක මධ්‍යන්‍ය (1961-1990)) වර්ෂාපතනය වගුව-01 හි දක්වා ඇති අතර මෙම අගයයන් මගින් දක්වා ඇත්තේ 2020 දෙසැම්බර්, 2021 ජනවාරි සහ පෙබරවාරි මාස වලදී එක් එක් දිස්ත්‍රික්ක සඳහා අපේක්ෂිත වර්ෂාපතන ප්‍රමාණයන් නොවන බව කාරුණිකව සලකන්න. මෙය ඔබගේ දැනගැනීම සඳහා සපයා ඇත.